# වාර්ෂික වාර්තාව
## 2012

KURUNEGALA PLANTATIONS LIMITED

## සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය

# අපගේ දැක්ම

ගිනිකොන දිග ආසියානු කලාපයේ ආදර්ශමත්ම වැව්ලි හා කෘෂි  ව්‍යාපාර කළමනාකාරිත්ව සමාගම බවට පත්වීම

# අපගේ මෙහෙවර

ස්වභාවික, භෞතික සහ මානව සම්පත් සමාජ වගකීමෙන් යුතුව උකහා ගෙන වැව්ලි සහ අනෙකුත් කෘෂි ව්‍යාපාරය ඵලදායි ලෙසත්, ලාභදායි ලෙසත් තිරසාර ලෙසත් කළමනාකරණය කරමින් ප්‍රතිලාභීන්ගේ ද උන්නතිය උදෙසා කටයුතු කිරීම

## පටුන

### කළමනාකරණ වාර්තා


සංස්ථාපිත තොරතුරු 01
අප ගැන 02
මූල්‍ය කැපි පෙනෙන කරුණු 03
සභාපතිතුමාගේ පණිවුඩය 04
අධ්‍යක්ෂ මණ්ඩලය 05
කළමණාකරන මඩුල්ල 06
ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ පණිවුඩය 07
අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 13
සාමුහික පාලන ප්‍රකාශය 15
අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය 16


### මූල්‍ය වාර්තා


ස්වාධීන විගණන වාර්තාව 17
විස්තීර්න ආදායම 18
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 19
සමකොටස් වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය 20
මුදල් සංසරණය පිළිබඳ ප්‍රකාශය 21
ගිණුම්කරන ප්‍රතිපත්ති 22
මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන් 26
10 වසරක සාරාංෂය 36
රැස්වීම පිළිබඳ දැන්වීම 38
පෙරකලාසි  පත්‍රය 39

# සාමූහික තොරතුරු

| | |
|---|---|
| **සමාගමේ නාමය** | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම |
| **නෛතික තත්ත්වය** | පූර්ණ රාජ්‍ය අයිතිය යටතේ ඇති සීමාසහිත පොදු සමාගමකි |
| **ලියාපදිංචි කාර්යාලය** | අංක 80, දඹුල්ල පාර, කුරුණෑගල |
| **සංස්ථාපනය කල දිනය** | 1992 ජූනි 18 |
| **සමාගම් ලියාපදිංචි අංකය.** | PB 1319 |
| **අධ්‍යක්ෂ මණ්ඩලය** | පණ්ඩුක ජයසිංහ මහතා - සභාපති/කලමනාකාර අධ්‍යක්ෂ<br>එම්.ජී.එස්.එන්.කුරේරා මහතා - විධායක අධ්‍යක්ෂ<br>ආර්.ඩබ්ලිව්.එම්.ජේ.ආර්. පෙරේරා මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ<br>ඩබ්ලිව්.ජී.චන්ද්‍රිකා මහත්මිය - මහා භාණ්ඩාගාර නියෝජිත<br>(2013 පෙබරවාරි 11 දින සිට ඉල්ලා අස්වී ඇත)<br>කේ.ඩී. පීරිස් මහතා<br>බී.ආර්.කුලරත්න මහතා<br>අයි.ජී.එම්. අප්පුහාමි මහතා |
| **විගණකවරු** | දයානන්ද සමරවික්‍රම සහ සමාගම<br>වරලත් ගණකාධිකාරිවරු,<br>අංක 20/26, දුම්රියපොල පාර, නුගේගොඩ.<br>දුරකථන අංක : 0112 854614, 0112 809650, 0112 822940<br>විද්‍යුත් තැපැල : dsandco@sltnet.lk |
| **බැංකුකරුවෝ** | ලංකා බැංකුව<br>මහජන බැංකුව<br>ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| **ලේකම්වරු** | කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම<br>47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස,<br>කොළඹ - 07<br>දුරකථන අංකය : 0112 695410<br>විද්‍යුත් තැපැල: deseram@deseram.com |
| **සම්බන්ධීකරණ තොරතුරු** | දුරකථන අංක : 037 2223133<br>ෆැක්ස් අංක : 037 2223191<br>විද්‍යුත් තැපැල : kurunegalaplt@sltnet.lk |

# අප ගැන...

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව ජනතා වතු සංවර්ධන මණ්ඩලය මගින් පාලනය වූ වතු සමූහයක කර්තව්‍ය භාරගෙන ව්‍යාපාර කටයුතු කරගෙනයාම සඳහා පිහිටුවන ලදී. 1992 ජූනි 18 වන දින සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත පොදු සමාගමක් ලෙස නීතිගත කරන ලදී.  පූර්ණ රාජ්‍ය අයිතිය යටතේ ඇති සමාගමක් ලෙස ක්‍රියාත්මක වන සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ සියළු කොටස් අයිතිය ස්වර්ණමය කොටස්කරුවන මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් උසුලනු ලබයි.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1992 ජූනි මස 18 වැනි දින සිට පෞද්ගලික අංශය මගින් කළමනාකරණය කරන ලදී. වසර 13ක පමණ කාලයක් පුරා ක්‍රියාත්මක වූ පෞද්ගලික කළමනාකරණයේ පැවති දුර්වලතා තුල සමාගම ආර්ථිකමය වශයෙන් ඵලදායි නොවූ අතර සමස්ථ පසු බෑමකට ලක් විය. ඒ අනුව සමාගමේ කළමනාකාරිත්වය 2005 ජනවාරි 1 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ රජයට පවරා ගන්නා ලදි. එතැන් පටන් විවිධ අමාත්‍යාංශ යටතේ පාලනය වූ සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 2010  වසරේ සිට පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

සමාගම විවිධාංගීකරණයෙන් යුත් කෘෂි භෝග, එනම් පොල්, රබර් සහ වෙනත් අතුරු බෝග නිෂ්පාදනය කිරීම, සැකසුම් කිරීම සහ අලෙවිකරණය යන ක්‍රියාදාමයන් තුල යෙදී සිටි.

හෙක්ටයාර් 5,316,43 වපසරියකින් යුත් සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම අත්තනගල්ල, දඹදෙණිය, ධාතුසේනපුර, දොඩන්ගස්ලන්ද, හිරියාල, කටුගම්පොල, කුරුණෑගල, මහයාය සහ නාරම්මල වශයෙන් හැඳින්වෙන පලාත් වතු 09 කින් සමන්විත වන අතර එකී වතු 09 න් 02 ක් ගම්පහ දිස්ත්‍රික්කයේද, 06 ක් කුරුණෑගල දිස්ත්‍රික්කයේද ඉතිරිය අනුරාධපුර දිස්ත්‍රික්කයේද පිහිටා ඇත. 2012 වසර තුලදී පරිපාලනමය අවශ්‍යතාවය මත වාරියපොල වතුයාය හිරියාල වතුයාය හා ඒකාබද්ධ කරන ලදී. හෙක්ටයාර් 4,151.36 ක පොල් වගා වපසරියක් සහ හෙක්ටයාර් 237.98 ක රබර් වගා වපසරියක් සමාගම සතුවේ.

කෘෂි ව්‍යාපාර ක්ෂේත්‍රයේ වාර්ෂිකව ඉහළ ඵලදායිතාවයක් සහ සුවිශේෂී ලාභ වාර්තා පිහිටුවීම සාමාන්‍ය සිද්ධියක් ලෙස සැලකීමට නොහැක. කුරුණෑගල වැවිලි සමාගම 2005 සිට මේ වන තුරු රාජ්‍ය කළමනාකරණය යටතේ ඉහළ ඵලදායිතාවයක් සහ සුවිශේෂි ලාභ වාර්තා පිහිටුවීම ශ්‍රී ලංකා වැවිලි ක්ෂේත්‍රයේ විරල ආශ්චර්යක් ලෙස සැලකිය හැකියි.



# මූල්‍ය ප්‍රගතියේ කැපී පෙනෙන අවස්ථා

| දෙසැම්බර් 31 වන, දිනෙන් අවසන් වන වසර සඳහා/දිනට | | 2012 | 2011 | විචල්‍යතාව % |
|---|---|---|---|---|
| **ඉපැයීම්** | | | | |
| අයභාරය | රු. | **483, 726,983** | 509,885,889 | (5) |
| වෙනත් මෙහෙයුම් ආදායම් | රු. | **114,554,007** | 84,795,280 | 35 |
| බදු පෙර ලාභය | රු. | **186,077,635** | 225,163,345 | (17) |
| බදු පසු ලාභය | රු. | **170,292,768** | 192,036,647 | (11) |
| දළ ලාභ ආන්තිකය | % | **43.05** | 50.49 | (15) |
| ශුද්ධ ලාභ ආන්තිකය | % | **35.20** | 37.66 | (7) |
| කොටසක ඉපයුම | රු. | **8.51** | 9.60 | (11) |
| **මූල්‍ය තත්ත්වය** | | | | |
| මුළු වත්කම් | රු. | **1,322,378,705** | 1,218,268,908 | 9 |
| කොටස්කරුවන්ගේ ප්‍රාග්ධනය | රු. | **962,207,615** | 840,369,406 | 14 |
| නිකුත් කළ කොටස් ප්‍රමාණය | රු. | **20,000,001** | 20,000,001 | 0 |
| කොටසක වත්කම | රු. | **48.11** | 42.02 | 14 |
| මුදල් හා මුදල් සමාන දෑ | රු. | **325,659,031** | 321,380,740 | 1 |
| ජංගම වත්කම් අනුපාතය | වාර ගණන | **2.71** | 2.67 | 2 |
| ක්ෂනික වත්කම් අනුපාතය | වාර ගණන | **2.49** | 2.34 | 6 |
| **වෙනත් තොරතුරු** | | | | |
| සේවක සංඛ්‍යාව | ගණන | **1,503** | 1,499 | 0 |
| සේවක අර්ථ සාධක, සේවක භාරකාර අරමුදල් ඇතුලත්ව වේතන හා වැටුප් | රු. | **205,525,353** | 189,180,160 | 9 |
| කාර්ය සාදනය මත පදනම්වූ දිරි දීමනා | රු. | **22,717,215** | 21,155,711 | 7 |
| ප්‍රසාද දීමනා | රු. | **7,458,393** | 7,089,625 | 5 |
| රජයට ගෙවන ලද බදු මුදල් | රු. | **21,769,885** | 12,421,695 | 75 |

# සභාපතිතුමන්ගේ පණිවුඩය



2012 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වසර සඳහා පිළියෙල කරන ලද සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

2012 වසරේ සමස්ථ ප්‍රතිඵලය සම්බන්ධව මම ආඩම්බර වෙමි. සමාගමේ ඉතිහාසය තුල වැඩිම ලාභයක් වාර්තාවූයේ පසුගි ය වසරේදීය. එහෙයින් 2012 වසර අභියෝගාත්මක වසරක් බවට පත්විය. සමාගම 2012 වසරේදී රුපියල් මිලියන 483.7 ක ආදායමක් ඉපයූ අතර රුපියල් මිලියන 170.3 ක බදු පසු ලාභයක් වාර්තා කිරීමට සමත් විය. 2012 වසර අවසානයේ කොටසක ඉපයුම රු. 8.51 ක් ලෙස වාර්තා විය. සමාගමේ ප්‍රධාන නිෂ්පාදන දෙක වන පොල් සහ රබර් වල මිල ගණන් 2012 වසරේදී විශාල පසුබෑමකට ලක්විය. එම තත්ත්වය තුල 2012 වසර තුලදී අප ලබාගත් ප්‍රතිඵලය ප්‍රශංසනීයයි.
2012 වසරේදී, වසරක් තුල නිෂ්පාදනය කළ වැඩිම පොල් අස්වැන්න වශයෙන් ගෙඩි මිලියන 18.1 ක් වාර්තා කිරීමට සමාගමට හැකි විය. එය 2011 වසරට වඩා 16% ක වැඩිවීමක් වූ අතර ජාතික පොල් නිෂ්පාදනයේ වාර්තාවූ වර්ධනයට වඩා 11% ක වර්ධනයක් විය. කෙසේ වුවත්, 2012 වසර තුල පැවති පහල ශුද්ධ විකුණුම් සාමාන්‍යය පොල් ආදායම පසුගිය වසරට සාපේක්ෂව 1% කින් අඩුවීමට හේතු විය.

2012 වසර තුලදී, වැඩිම රබර් කිරි අස්වැන්නක් ලබාදෙන මාසවල පැවති අහිතකර කාලගුණික තත්ත්වය තුල ජාතික රබර් නිෂ්පාදනයේ අඩුවක් පෙන්නුම් කල අතර ඒ හා සමගාමීව සමාගමේ රබර් නිෂ්පාදනයද 8% ක අඩුවක් පෙන්නුම් කෙරිනි. මෙම තත්ත්වයත් සමග රබර් මිලෙහි ඇතිවූ තියුණු පසුබැස්ම හේතුකොට ගෙන සමාගමේ රබර් ආදායම පසුගිය වසරට සාපේක්ෂව 25% කින් අඩුවිය.

සමාගම 2012 වසරේදි නැවත වගාකිරීම, යටිවගා ඇති කිරීම සහ අතුරු බෝග ව්‍යාප්තිය උදෙසා රුපියල් මිලියන 73.4 ක් ආයෝජනය කර ඇත. මීට අමතරව, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 91.4 ක් ආයෝජනය කරන ලදී.

2012 වසර අවසන් වන විට සමාගමේ මුල්‍ය තත්වය තවත් දියුණු වී ඇත. සමාගම පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ රටේ පොල් කර්මාන්තයේ උන්නතිය සඳහා දායක වී ඇත. පොල් ව්‍යාප්තිය වර්ධනය කිරීම සඳහා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය මගින් ජාතික මට්ටමින් ගෙන යනු ලබන වැඩ පිළිවෙලට උරදීම සඳහා රුපියල් මිලියන 21 කට වැඩි වටිනාකමක් ඇති බීජ පොල් පැල තුන් ලක්ෂයක් පොල් වගා කිරීමේ මණ්ඩලයට ලබා දෙන ලදී. මීට අමතරව බීජ පොල් පැල නිෂ්පාදනය සඳහා රුපියල් මිලියන 38.2 ක් වටිනා බීජ පොල් මිලියන 2 ක් පොල් වගා කිරීමේ මණ්ඩලයට ලබා දුනි.
කුරුණෑගල වැවිලි සමාගමේ විශිෂ්ඨ ප්‍රගතිය සහ ජාතික දායකත්වය අගයමින් 2012 වසරේදී කුරුණෑගල වැවිලි සමාගම ජාතික කෘෂි ව්‍යාපාර ස්වර්ණ සම්මානයෙන් පිදුම් ලැබීය. ඉතිහාසයේ සමාගම ලබා ගත් වඩාත්ම ගෞරවාන්විත ජයග්‍රහනය ලෙස මෙය සැලකිය හැකිය. එම වසරේදීම කුරුණෑගල වැවිලි සමාගම මහා පරිමාන නිෂ්පාදක (වැවිලි) අංශයට පිරිනමනු ලබූ ජාතික කෘෂි ව්‍යාපාර ස්වර්ණ සම්මානයද දිනා ගැනීමට සමත් විය.

ලබාදුන් විශිෂ්ඨ දායකත්වය වෙනුවෙන් සියලුම තරාතිරම්වල සේවක පිරිසටත් සමාගම කෙරේ උනන්දුව දක්වන අනෙකුත් පාර්ශවයන්ටත් මාගේ ස්තුති පූර්වක ප්‍රණාමය පුද කිරීමට කැමැත්තෙමි. එසේම, නිරන්තර මග පෙන්වීම් සහ සහයෝගය ලබාදෙන අධ්‍යක්ෂ මණ්ඩලයටත් මාගේ ගෞරවනීය ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.

තවද, ගුණාත්මක බවින් උසස් පොල් පැල සහ බීජ පොල් සැපීම තුලින් ජාතික පොල් සංවර්ධන වැඩ සටහනට ක්‍රියාකාරිව සම්බන්ද වීමට අවස්ථාවක් ලබා දීම සම්බන්ධවද, පොල් වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීමට සහ නිෂ්පාදන පිරිවැය කළමනාකරණය කර ගැනීම සඳහා මහත් රුකුලක් වන පොහොර සහනාධාර වැඩ පිලිවෙල 2012 වසර සඳහාද දීර්ඝ කිරීමට කටයුතු කිරීම වෙනුවෙන් ද මයිටා උවදුර මගින් පොල් වගාවට සිදුවන හානිය සාර්ථකව මැඩ පැවැත්වීම සඳහා විලෝපික මයිටා අභිජනන මධ්‍යස්ථාන පිහිටු වීමට කටයුතු කිරීම වෙනුවෙන්ද ඊ රාජ්‍ය ප්‍රත්පත්තිය යටතේ පොල් වගා කළමනාකරණ ජාලගත මෙහෙයුම් පද්ධතියක් හඳුන්වා දීම වෙනුවෙන්ද පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාටත්, අමාත්‍යංශ ලේකම්තුමාටත් අනෙකුත් අමාත්‍යාංශ නිලධාරින්ටත් ස්තුති කිරීම මාගේ වගකීමකි.

පණ්ඩුක ජයසිංහ
(සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ)

# අධ්‍යක්ෂ මණ්ඩලය




**පණ්ඩුක ජයසිංහ මහතා** (සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ)

කුරුණෑගල වැවිලි සමාගමේ වර්තමාන සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ ලෙස කටයුතු කරන්නේ පණ්ඩුක ජයසිංහ මහතාය. ඔහු 2010 මැයි මස 17 වන දින කුරුණෑගල වැවිලි සමාගමේ සභාපතිධූරයට පත්වූ අතර 2010 ජූනි මස 24 දින සිට සමාගමේ සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ ලෙස පත් කරනු ලැබීය.

**එම්.ඒ.එස්.එන්. කුරේරා මහතා** (විධායක අධ්‍යක්ෂ)

2010 මැයි මස 17 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

**ආර්.ඩබ්ලිව්.එම්.ජේ.ආර්. පෙරේරා මහතා** (ක්‍රියාකාරී අධ්‍යක්ෂ)

2010 මැයි මස 17 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

**ඩබ්ලිව්.ජී. චන්ද්‍රිකා මහත්මිය** (භාණ්ඩාගාර නියෝජිත)

2010 ජූනි මස 17 වැනි දින කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂිකාවක ලෙස පත් කරනු ලැබූ ඇය භාණ්ඩාගාර නියෝජිතවරිය ලෙස කටයුතු කරනු ලැබීය. ඇය. 2013 පෙබරවාරි 11 දින අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වී ඇත. ඇය සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ විගණන කමිටුවේ සභාපති ලෙසද ක්‍රියා කළාය.

**කේ.ඩී.පිරිස් මහතා**

2010 මැයි මස 17 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

**බී.ආර්.කුලරත්න මහතා**

2010 මැයි මස 17 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

**අයි.ඒ.එම්.අප්පුහාමි මහතා**

2010 මැයි මස 17 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

# කළමනාකරණ මණ්ඩලය




ප්‍රධාන විධායක නිලධාරි
**එන්.එම්.එස්.කේ. නිල්ලේගොඩ මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
**එස්.එම්.එම්. සමරකෝන් මහතා**

කළමණාකරු - මූල්‍ය
**පී.එම්.ඩී.ජී. ප්‍රේමතිලක මහතා**

කළමණාකරු - විගණන
**එම්.එම්.ජේ. කුරේ මහතා**

කළමණාකරු - මානව සම්පත් හා පරිපාලන
**අයි.ඒ. ගුණවර්ධන මහතා**

කළමණාකරු - වතු අධීක්‍ෂණ හා සම්බන්ධිකරණ
**එස්.එම්.ආර්.පී. සත්කුමාර මහතා**

## පළාත් වතු අධිකාරීවරුන්

කේ.ජේ.එස්. පෙරේරා මහතා
ජී.කේ.ඒ. ජයවර්ධන මහතා
යූ.ඩබ්ලිව්.බී.ඒ. වේරගොඩ මහතා
ඒ.ටී. ගමගේ මහතා
එම්.එල්.ඒ.පී. පෙරේරා මහතා
කේ.එල්.එච්.සී. පෙරේරා මහතා
ඒ.එම්.පී. අබේකෝන් මහතා
කේ.පී.ඩී.එන්. කලුගල්ල මහතා

## සහකාර වතු අධිකාරීවරුන්

ජේ.ඒ.ආර්. දුනුවිල මහතා
ආර්.කේ.එච්. පුෂ්පකුමාර මහතා
එච්.කේ.ජී.ඒ. රූපසිංහ මහතා
කේ.ජී.කේ.ඩී. සුමනදාස මහතා
ජේ.එම්.ඒ.ඒ. මුණසිංහ මහතා
ඒ.ජේ.එම්.අයි. සෙනෙවිරත්න මහතා
ඩී.එම්.පී. දිසානායක මහතා
එම්.ජී.එල්.යූ. මංගලගම මහතා
ඒ.ආර්. උඩමුල්ල මහතා
ජේ.එච්.බී. රණවීර මහතා
ජේ.එම්.එන්. සුබසිංහ මහතා
එස්.සී. විජේතිලක මහතා
ජී.කේ.ඒ. වෛද්‍යරත්න මහතා

# ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ වාර්තාව



රජයේ පුද්ගලීකරණ ප්‍රතිපත්තිය යටතේ ප්‍රාදේශීය වැවිලි සමාගමක් ලෙස 1992 වසරේ පිහිට වූ කුරුණෑගල වැවිලි සමාගමේ කළමනාකාරිත්වය පෞද්ගලික අංශය මගින් කරගෙන යනු ලැබීය. වසර 12 කට වඩා වැඩි කාල පරිච්ඡේදයක් පෞද්ගලික කළමනාකරණය යටතේ ක්‍රියාත්මක වූ කුරුණෑගල වැවිලි සමාගම පසුබෑමකට ලක් වූ අතර බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි විය. මෙම තත්ත්වය 2005 ජනවාරි 01 වන දින සිට සමාගමේ කළමනාකාරිත්වය රජයට පවරාගැනීමට හේතු පාදක විය. මෙය කුරුණෑගල වැවිලි සමාගමේ ඉතිහාසයේ හැරවුම් ලක්ෂය ලෙස සැලකිය හැකිය.

රාජ්‍ය කළමනාකරණය හමුවේ පැවති ප්‍රබල අභියෝගය වූයේ සමාගම ලාභදායී ව්‍යවසායක් බවට පරිවර්තනය කරමින් උසස් තත්ත්වයක් කරා ගෙන ඒමයි. තම ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ අභියෝග හඳුනාගත් කළමනාකරණය සියලු තරාතිරම් වල සේවකයින්ගේ හැකියාවන් යොදා ගනිමින් සමාගමේ අභිවෘධිය සඳහා කටයුතු කල අතර සමාගම සතු සත්‍යය විභවය උකහා ගැනීමට කටයුතු කරන ලදී. සෑම වත්තක්ම වෙන් වෙන්ව ඇගැයීමට ලක් කොට එහි ප්‍රධාන බෝගය වන පොල් වගාවෙන් උපරිම නිෂ්පාදනයක් ලබා ගැනීමට සැලසුම් කරන ලදී.

පොල් යටි වගා ඇති කිරීම සහ පාළු සිටුවීම සඳහා ප්‍රමුඛත්වයක් දෙමින් පොල් වගාව යටතේ අතුරුබෝග ව්‍යාප්තිය වර්ධනය කිරීම තුල භූමියේ ඵලදායීතාවය උපරිම කිරීමට කටයුතු කරන ලදී. තවත් වසර 10 කට වඩා වැඩි ඉදිරි කාලයක් තුල රබර් කිරි සඳහා පවතින අඛණ්ඩ ඉල්ලුම පදනම් කරගෙන අත්තනගල්ල, මහයාය සහ දොඩන්ගස්ලන්ද වතුයායන්ට අමතරව රබර් වගාව ස්ථාපනය කිරීමට සුදුසු වෙනත් වතුයායන් හඳුනාගෙන රබර් වගාව ව්‍යාප්ත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව කුරුණෑගල සහ නාරම්මල යන වතු තව දුරටත් රබර් වගාව ව්‍යාප්ත කිරීමට යෝග්‍ය පළාත් වතු ලෙස හඳුනා ගෙන ඇත.

පොල් සහ රබර් වලට අගය එකතු කිරීම වැදගත් කර්තව්‍යක් ලෙස හඳුනාගෙන ඇති අතර ඒ සඳහා සමාගම පොල් තෙල් සහ දුම් ගැසු රබර් ෂීට් නිෂ්පාදනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

## ආදායම

2011 වසරට සාපේක්ෂව 2012 වසරේදී සමාගම ලැබූ ආදායම රුපියල් මිලියන 26.2 ක අඩුවක් වාර්තා කර ඇත. මීට ප්‍රධාන හේතුව වූයේ පසුගිය වසරට සාපේක්ෂව රබර් පිරිවැටුම 25% කින් පමණ පහල යාමයි.

ආදායමේ හැසිරීම




ආදායමේ සංයුතිය




## පොල් ආදායම

පොල් ගෙඩියක ශුද්ධ විකුණුම් සාමාන්‍ය (NSA) 2011 වසරට සාපේක්ෂව 2012 වසරේදී 15%කින් පමණ පහල ගොස් ඇත. (NSA 2012– Rs. 21.87, NSA 2011 – Rs. 25.68). 2012 වසරේදී සමාගම වසරක වැඩිම පොල් අස්වැන්න ලෙස ගෙඩි මිලියන 18.1 ක් වාර්තා කල අතර එය පසුගිය වසරට සාපේක්ෂව 16% ක වැඩිවීමකි. ජාතික මට්ටමේ පොල් නිෂ්පාදනයේ වාර්තා වූ වැඩිවීම 4.7% කි. පොල් ගෙඩියක ශුද්ධ විකුණුම් සාමාන්‍ය පහල යාම පොල් ආදායම රුපියල් මිලියන 68.9 කින් අඩුවීමට හේතු වුවද වැඩි වූ පොල් අස්වැන්න එම පොල් ආදායම රුපියල් මිලියන 65.7 කින් වැඩි කිරීමට හේතුවීය. ඒ අනුව සමස්ථ පොල් ආදායම පසුගිය වසරට වඩා 1% ක අඩු මට්ටමක රඳවා ගැනීමට සමාගමට හැකි විය.

පොල් නිෂ්පාදනයේ හැසිරීම




පොල් ආදායම සහ
ශුද්ධ විකුණුම් සාමාන්‍යයේ හැසිරීම




## රබර් ආදායම

2012 වසර තුලදී වඩාත් වැඩි රබර් කිරි අස්වැන්නක් ලබාදෙන මාසවල පැවති අහිතකර කාලගුණික තත්ත්වය තුල සමාගමේ රබර් නිෂ්පාදනය 8% කින් පමණ පහල යාමට හේතු විය.

රබර් මිලෙහි වූ තියුණු පසුබැස්ම මෙම අහිතකර තත්ත්වය තව දුරටත් වර්ධනය කිරීමට හේතු විය. 2011 වසරට සාපේක්ෂව රබර් කිලෝවක ශුද්ධ විකුණුම් සාමාන්‍ය 19% ක පහල වැටීමක් වාර්තා කරයි. ශුද්ධ විකුණුම් සාමාන්‍යයේ පහල යාම මත රබර් ආදායම රුපියල් මිලියන 17.9 කින් සහ නිෂ්පාදනය අඩුවීම තුල රබර් ආදායම රුපියල් මිලියන 8.3 කින් අඩු විය.

රබර් නිෂ්පාදනයේ හැසිරීම




රබර් ආදායම හා
ශුද්ධ විකුණුම් සාමාන්‍යයේ හැසිරීම




## ආදායම - වෙනත් භෝග

2012 වසරේදී වෙනත් භෝග වලින් ලද ආදායම රුපියල් මිලියන 9.7 වූ අතර එය පෙර වර්ෂයේ වූ රුපියල් මිලියන 6.5 ට සාපේක්ෂව 50% ක වර්ධනයකි. 2012 වසරේදී වෙනත් භෝග වලින් ලැබූ ශුද්ධ ලාභය රුපියල් මිලියන 2.7 කි. මෙය භූමිය උපරිම ලෙස උපයෝජනය කිරීමේ සහ විවිධාංගීකරණයේ ප්‍රතිඵලයකි. සමාගම භෝග විවිධාංගීකරණය තුලින් ඉදිරියේදී තව දුරටත් වෙනත් බෝග වලින් ලැබෙන ආදායම වාර්ෂිකව වර්ධනය කර ගැනීමට අපේක්‍ෂා කරයි.

වෙනත් බෝග වලින් ලද ආදායමෙහි හැසිරීම




## වෙනත් මෙහෙයුම් ආදායම් සහ පොලී ආදායම්

2012 වසරේදී සමාගම ඵල නොදරන පොල් ගස් විකිණීම, දව සහ පොල් ලෙලි අලෙවිය වැනි වෙනත් මෙහෙයුම් කටයුතු තුලින් ලද ආදායම රුපියල් මිලියන 76.4 ක් වූ අතර 2011 වසරේදී එම ආදායම රුපියල් මිලියන 62.4 ක් විය. මීට අමතරව කෙටි කාලීන ආයෝජන වලින් රුපියල් මිලියන 38.2 ක (2011 රුපියල් මිලියන 22.4) පොලී ආදායමක් උපයා ඇත.

## මූල්‍ය වියදම්

මූල්‍ය වියදම් වලින් වැඩි කොටස වන්නේ කල්බදු ඉඩම් සඳහා ගෙවූ රුපියල් මිලියන 30.8 ක පොලී වියදමයි.

බදු පෙර ලාභය සහ බදු පසු ලාභය




## බදු පෙර සහ බදු පසු ලාභය

සමාගම 2012 වසරේදී රුපියල් මිලියන 186 ක බදු පෙර ලාභයක් සහ රුපියල් මිලියන 170 ක බදු පසු ලාභයක් උපයා ඇත. 2011 වසරේදී එම අගයන් පිළිවෙලින් රුපියල් මිලියන 225 ක් සහ රුපියල් මිලියන 192 ක් ලෙස සටහන් ව තිබිණි.

# ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ වාර්තාව

### ලාභාංශ

කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය කළමනාකරණය යටතේ ක්‍රියාත්මක වන ස්වයං මූල්‍යන ව්‍යවසායක් බව පවසන්නේ ආඩම්බරයෙනි. 2012 වසර සඳහා සමාගමේ කොටසක ඉපැයුම රුපියල් 8.51 ක් ලෙස වාර්තා වේ. 2012 වසර වෙනුවෙන් රුපියල් මිලියන 30 ක ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

### මුදල් තත්ත්වය සහ ද්‍රව්‍යශීලතාව

### මූල්‍ය ව්‍යුහය

2011 වසරේ රුපියල් මිලියන 1,238 ක්ව පැවති මුළු වත්කම් ප්‍රමාණය 2012 වසර අවසානයේදී රුපියල් මිලියන 1,322 දක්වා වැඩි කිරීමට හැකිවූ අතර එය රුපියල් මිලියන 104 ක වර්ධනයකි. මෙම මුළු වත්කම ජංගම නොවන වත්කම් රුපියල් මිලියන 866 කින්ද ජංගම වත්කම් රුපියල් මිලියන 457 කින්ද සමන්විත වේ. 2011 වසර සඳහා මෙම අගයන් පිළිවෙලින් රුපියල් මිලියන 746 ක් හා 472 ලෙස වාර්තා විය. 2011 වසර අවසානයේ පැවති රුපියල් මිලියන 321 ක මුදල් සහ කෙටි කාලීන ආයෝජන 2012 වසර අවසානයේදී රුපියල් මිලියන 326 ක් දක්වා වර්ධනය විය.







### ද්‍රවශීලිතාවය

2.68 ක්ව පැවති ජංගම වත්කම් අනුපාතය 2.71 දක්වා ද ක්ෂණික වත්කම් අනුපාතය 2.35 සිට 2.49 දක්වා ද පසු ගිය වසරට සාපේක්ෂකව වර්ධනය වී ඇත.

# ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ වාර්තාව

## මුදල් ප්‍රවාහ

2012 වසර අවසානයේදී පසු ගිය වසරට සාපේක්ෂව මුදල් හා මුදල් සමාන දෑ වල රුපියල් මිලියන 4.6 ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙයට විශේෂයෙන්ම මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයේ වර්ධනය හේතු විය. පෙර වසරේ රුපියල් මිලියන 291 ක් වූ කාරක ප්‍රාග්ධන ගැලපීම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රුපියල් මිලියන 233 දක්වා අඩුවීමක් පෙන්නුම් කරයි. කෙසේ වුවද මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය කරන ලද මුදල් ප්‍රවාහය රුපියල් මිලියන 196.6 සිට රුපියල් මිලියන 203.7 ක් දක්වා වර්ධනය විය. ඊට මූලික හේතු වූයේ තොග, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ වල අඩු වීම තුල ඇතිවූ ධනාත්මක කාරක ප්‍රග්ධන වෙනස් වීමයි.

## ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය

"තිරසාර සංවර්ධනය" යන දීර්ඝකාලීන උපායමාර්ගය යටතේ 2012 වසරේදී ද සමාගම සංවර්ධන සහ විවිධාංගීකරණ වැඩසටහන් අඛණ්ඩව සිදු කරන ලදි. 2012 වසර තුලදී ප්‍රාග්ධන වත්කම් සඳහා සමාගම රුපියල් මිලියන 165 ක් ආයෝජනය කර ඇත. ඉන් රුපියල් මිලියන 73 ක් යොදවා ඇත්තේ යටි වගා සහ නැවත වගා ඇති කිරීමට සහ නොමේරූ වගා නඩත්තු කිරීම සඳහා ය. ඉතිරිය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වැය කරන ලදී. 2012 වසරේදී වතු සේවානියුක්තිකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ දැමීමේ අරමුණින් සමාගම නව මුරකුටි 14 ක් සහ ස්ථානභාර නිලධාරි නිළ නිවාස 03 ඉදිකරන ලදී.

**ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය සඳහා වියදම**




## මානව සම්පත

2012 වසරේදී, කුසලතා වර්ධනය, දැනුම හා හැකියා සංවර්ධනය, කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ සේවාවේ ගුණාත්මකභාවය අරමුණු කර ගත් පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. මෙම වැඩ සටහන් මානව ප්‍රාග්ධන සංවර්ධනයට විශාල දායකත්වයක් ලබා දී ඇත. එසේම 2012 වසරේදී කණ්ඩායම් හැඟීම වර්ධනය පිණිස අන්තර් වතු ක්‍රිකට් තරඟාවලිය, සර්ව රාත්‍රික පිරිත් දේශනය, පොසොන් දන්සැල, වාර්ෂික පවුල් එකමුතුව සහ වාර්ෂික විනෝද චාරිකාව වැනි විවිධ ක්‍රියාකාරකම් රැසක් සමාගම විසින් සංවිධානය කරන ලදී. සියලුම තරාතිරම්වල සේවානියුක්තිකයින්ගේ දූ දරුවන්ගේ උසස් අධ්‍යාපන කටයුතු වලට උපකාරී වීම සඳහා සමාගම මගින් ස්ථාපිත කළ ශිෂ්‍යාධාර වැඩ පිළිවෙල යටතේ රුපියල් 225,000 ක් වටිනා ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.

**පුද්ගල වියදම්**




සේවානියුක්තිකයින් මුහුණ දෙන විවිධ අපදා තත්ත්වයන්ට උපකාරයක් ලෙස දෙනු ලබන අපදා ණය පහසුකම තවදුරටත් වර්ධනය කල අතර 2012 වසරේදී රුපියල් මිලියන 11.09 ක් වටිනා ණය පහසුකම් ප්‍රමාණයක් ලබා දීමට සමාගම කටයුතු කරන ලදී.

# ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ වාර්තාව

සමාගම සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා භාරකාර අරමුදල් ඇතුලත්ව වැටුප් හා වේතන ලෙස රුපියල් මිලියන 205.5 ක් ගෙවා ඇත. එසේම කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා සඳහා රුපියල් මිලියන 22.7 ක් සහ ප්‍රසාද දීමනා සඳහා රුපියල් මිලියන 7.5 ක මුදලක් වෙන් කර ඇත.

## ජාතික ස්වර්ණ සම්මාන දිනා ගැනීම

ජාතික කෘෂි ව්‍යාපාර කවුන්සිලය මගින් සංවිධානය කරනු ලැබූ 2012 ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන උළෙලේදී සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ජාතික කෘෂි ව්‍යාපාර ස්වර්ණ සම්මානයද, මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා වූ ස්වර්ණ සම්මානයද ජයග්‍රහනය කරන ලදී.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ සාර්ථකත්වයට එහි සියලුම සේවා නියුක්තකයින්ගේ මාහැඟි දායකත්වය හා කැපවීම හේතු විය. උපරිම ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා සේවානියුක්තිකයින්ට හිතවාදී සේවා පරිසරයක් බිහි කිරීමටත් අවශ්‍ය දැනුම සහ පුද්ගල සංවර්ධයට අවශ්‍ය දේ ලබා දීමටත් කළමනාකරණය සැමවිටම උත්සුක වී ඇත.

මෙම ගමන් මග අනුව ගිනිකොණ දිග ආසියානු කලාපයේ ආදර්ශමත්ම වැවිලි හා කෘෂි ව්‍යාපාරික කළමනාකාරිත්ව සමාගම බවට පත්වීමේ ඉලක්කය ලඟා කර ගැනීමට කුරුණෑගල වැවිලි සමාගමට හැකිවන බවට කිසිදු සැකයක් නැත.

සමාගමේ අභිවෘර්ධිය වෙනුවෙන් නිරන්තර උපදෙස් හා මගපෙන්වීම් ලබා දෙන පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු අමාත්‍යතුමාට, ගරු ලේකම්තුමාට, අමාත්‍යාංශයේ අනෙකුත් සියලුම නිලධාරීන්ට, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ සභාපතිතුමා ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයට සහ මෙවන් විශිෂ්ඨ ප්‍රතිඵලයක් ලබා ගැනීමට කැපවීමෙන් සහ උද්යෝගයෙන් සේවය කරන සියලුම සේවා නියුක්තිකයින්ට මගේ ස්තුතිය මෙයින් පිරිනමමි.

සුනිල් නිල්ලේගොඩ



# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2012 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඇතුලත් සීමාසහිත කුරුණෑගල වැවැලි සමාගමේ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන වගයි.

## හැඳින්වීම

1992 ජූනි 18 දින පූර්ණ රාජ්‍ය අයිතිය යටතේ වූ සීමාසහිත සමාග මක් ලෙස සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම පිහිටුවන ලදී. 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව 2010 මාර්තු මස 17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගම නැවත ලියාපදිංචිකර ඇති අතර නව ලියාපදිංචි අංකය පී.බී. 1310 වේ.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම විවිධාංගීකරණයෙන් යුත් කෘෂි නිෂ්පාදන සමූහයක් කළමනාකරණය කරනු ලබයි. ඒ අනුව සමාගම පොල්, රබර් හා වෙනත් බෝග වගා කිරීම, නිෂ්පාදනය කිරීම, සැකසුම් කිරීම හා අලෙවිකරණය යන ක්‍රියාදාමය තුල යෙදී සිටි.

## අඛණ්ඩ පැවැත්ම

දුර දක්නා අනාගත කාලයක් සමාගමේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් පරිදි සමාගම සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වේ. ඒ අනුව ගිණුම් වාර්තා අඛන්ඩ පැවැත්ම සංකල්පය යටතේ පිළියෙල කර ඇත.

## මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තා

2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්සන් කර සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර ඇත.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගනු ලැබූ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශනය තුල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යන කොටසෙහි ඇතුලත්කර ඇත.

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂයද ඇතුලත්ව පෙර සියලුම ගිණුම් වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ 2011 දෙසැම්බර් 31 වන දින දක්වා බලපවත්වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLAS) භාවිතා කරමිනි.

2012 ජනවාරි 01 වන දින සිට අනුගමනය කළයුතු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/LKAS) අනුගමනය කරමින් සකස් කරන ලද සමාගමේ ප්‍රථම මූල්‍ය ප්‍රකාශන වන්නේ 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශන වේ.

## අයභාරය

2012 වසරේදී සමාගම ඉපයූ මුළු ආදායම රුපියල් මිලියන 483.7 කි. (2011 -රුපියල් මිලියන 509.9) මීට අමතරව වර්ෂය තුල මෙහෙයුම් ආදායම් ලෙස රුපියල් මිලියන 76.4 (2011 - රුපියල් මිලියන 62.4) සහ පොලී ආදායම් ලෙස රුපියල් මිලියන 38.2 (2011 - රුපියල් මිලියන 22.4) උපයා ඇත.

## ප්‍රතිඵල සහ විසර්ජනයන්

සමාගමේ බදු පසු ලාභය රුපියල් මිලියන 170.3 කි. (2011 - රුපියල් මිලියන 192.0) සමාගමේ මුල්‍ය ලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙන් විද්‍යාමාන වේ.

| ලාභ සහ විසර්ජනයන් පහත සඳහන් වේ. | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| පොල් වලින් ලද ලාභය | 172,934,188 | 199,076,145 |
| රබර් වලින් ලද ලාභය | 33,318,065 | 58,669,015 |
| වෙනත් බෝග වලින් ලද ලාභ/අලාභ | 3,157,262 | 459,556 |
| වෙනත් මෙහෙයුම් ආදායම් - පොලී ආදායම් හැර | 75,170,669 | 61,597439 |
| පොලී ආදායම් | 38,200,820 | 22,426,141 |
| | 322,781,004 | 342,228,296 |
| පරිපාලන වියදම් | (104,816,036) | (88,442,422) |
| මූල්‍ය වියදම් | | |
| කල්බදු ඉඩම් සඳහා වන පොලී වියදම් | (30,847,790) | (28,429,380) |
| වෙනත් මූල්‍ය වියදම් | (1,039,543) | (193,149) |
| බදු පෙර ලාභය | 186,077,635 | 225,163,345 |
| මෙම වසරේ ආදායම් බදු වියදම | (7,778,863) | (16,137,149) |
| විලම්භිත ආදායම් බදු | (8,006,004) | (16,989,549) |
| බදු පසු ලාභය | 170,292,768 | 192,036,647 |
| පසුගිය වසරෙන් ඉදිරියට ගෙනා ලාභ | 644,668,414 | 522,631,767 |
| විසර්ජනය සඳහා ඉතිරි වූ ශේෂය | 814,961,182 | 714,668,414 |
| විසර්ජනයන් - ලාභාංශ ගෙවීම් | (50,000,000) | (70,000,000) |
| ඉදිරියට ගෙන යන ශේෂය | 764,961,182 | 644,668,414 |

## ප්‍රාග්ධන වියදම් සහ ආයෝජන

2012 වර්ෂයේදී සමාගම රුපියල් මිලියන 164.8 ක් (2011 - රුපියල් මිලියන 81.6) ස්ථාවර වත්කම්වල ආයෝජනය කළ අතර ඉන් රුපියල් මිලියන 73.4 ක් (2011 - රුපියල් මිලියන 53.6) නොමේරූ වගාවන් වෙනුවෙන් යෙදවූ අතර රුපියල් මිලියන 34.5 ක් ගොඩනැගිලි ඉදිකිරීමට හා ප්‍රතිසංස්කරණය කිරීමටත් ඉතිරි රුපියල් මිලියන 56.9 වෙනත් යටිතල පහසුකම් සංවර්ධනයටත් යොදවන ලදී.

### කෙටිකාලීන ආයෝජන
2012 දෙසැම්බර් 31 වෙන දිනට සමාගම සතුව රුපියල් මිලියන 320.0 ක (2011- රුපියල් මිලියන 300.6) කෙටි කාලින ආයෝජන ප්‍රමාණයක් පැවතිනි. මෙම කෙටි කාලින ආයෝජන රජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ලෙස පැවතිනි. (රුපියල් මිලියන 79.5 ලංකා බැංකුවේද, රුපියල් මිලියන 10.0 ක් මහජන බැංකවේද, රුපියල් මිලියන 230.5 ක් ජාතික ඉතිරි කිරිමේ බැංකුවේද වශයෙනි).

### කොටස් ප්‍රාග්ධනය
කොටස් අලෙවියෙන් ලද සම්පූර්ණ වටිනාකම කොටස් ප්‍රාග්ධනය ලෙස හඳුන්වනු ලබේ. 2012 දෙසැම්බර් මස 31 වැනි දිනට සමාගමේ සමස්ථ කොටස් ප්‍රාග්ධනය රුපියල් 200,000,010 ක් විය. මෙය සාමන්‍ය කොටස් 20,000 කින් සහ ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් උසුලන එක් ස්වර්ණමය කොටසකින්ද සමන්විත වේ. සමාගම 2012 වසර තුල කිසිදු ආකාරයක කොටස් නිකුත් කිරීමක් සිදු කර නැත.

### සංචිත
සමාගමේ ඇති එකම සංචිත ප්‍රාග්ධනය වන්නේ රඳවාගත් ලාභයයි. 2012 දෙසැම්බර් 31 වැනි දිනට එහි වටිනාකම රුපියල් මිලියන 765 කි. (2011 - රුපියල් මිලියන 645)

### අධ්‍යක්ෂ මණ්ඩලය
2012 වර්ෂය තුල පහත සඳහන් මහත්ම මහත්මීන් සීමාසහිත කුරුණෑගල වැව්ලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සාමාජිකාවන් ලෙස කටයුතු කරන ලදී.

පණ්ඩුක ජයසිංහ මහතා
සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ
එම්.ඒ.එස්.එන්.කුරේරා මහතා
විධායක අධ්‍යක්ෂ
ආර්. ඩබ්ලිව් එම්. ආර්. පෙරේරා මහතා
ක්‍රියාකාරි අධ්‍යක්ෂ
ඩබ්ලිව්. ජී. චන්ද්‍රිකා මහත්මිය
මහා භාණ්ඩාගාර නියෝජිත
(2013 පෙබරවාරි 11 දින සිට ඉල්ලා අස්වී ඇත)
කේ.ඩී. පීරිස් මහතා
බී.ආර්.කුලරත්න මහතා
අයි.ඒ.එම් අප්පුහාමි මහතා

### අධ්‍යක්ෂවරුන් සහ සමාගම අතර ඇති සම්බන්ධය
සමාගමේ අධ්‍යක්ෂවරු සමාගමේ ගනුදෙනු කෙරේ ඍජුව හෝ වක්‍රව හෝ කිසිදු ආකාරයකින් හෝ බලපාන ආකාරයක ගිවිසුම් වලට එළඹී නැත.

### අධ්‍යක්ෂවරන්ගේ කොටස් අයිතිය
සමාගමේ කිසිම අධ්‍යක්ෂවරයෙකු හෝ ඔවුන්ගේ කාලත්‍රයෙකු සමාගමේ කොටස් සඳහා හිමිකම් නොකියයි.

### විගණන කමිටුව
පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 2012 වර්ෂයේදී විගණන කමිටුව නියෝජනය කලෝය.

- ඩබ්ලිව්. ජී. චන්ද්‍රිකා මහත්මිය - සභාපති (මහා භාණ්ඩාගාර නියෝජිත)
- බී.ආර්. කුලරත්න මහතා
- අයි.ඒ.එම් අප්පුහාමි මහතා

### සේවා නියුක්තිය
සේවකයින් තෝරා ගැනීම, පුහුණු කිරීම, සංවර්ධනය හා උසස් කිරිම යන ක්‍රියාවලියන්හිදී ජාතිය, ආගමික, දේශපාලනික, ලිංගික, විවාහක හෝ අවිවාහක භාවය යන වෙනස්කම් කෙරෙහි අවධානය යොමු නොකොට සමානාත්මතා සංකල්පය මත ක්‍රියා කිරීමට සමාගම සෑම අවස්ථාවකදීම කටයුතු කරයි.

### ව්‍යවස්ථාපිත ගෙවීම්
සමාගම විසින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියළුම බදු සහ සමාගමේ සේවකයින් සඳහා ගෙවියයුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් දන්නා ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති බවට හෝ ගෙවීම් සිදු කිරිම සඳහා ප්‍රතිපාදන ඇතිකර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

### මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට පසු සිදුවීම්
මූල්‍යවාර්තා ඉදිරිපත්කරන දිනයේ සිට මෙම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාව දක්වා ගිණුම් ප්‍රකාශන සංශෝදනය කිරිමට හෝ එසේ නැතහොත් ඒ තුල ගැලපීම් කිරිමට හෝ ඒ තුල අනාවරණය කිරිමට හෝ අවශ්‍ය වන තරම් ප්‍රමාණවත් සිද්ධීන් සිදු වී නොමැත.

### විගණකවරු
2012 වසර සඳහා වූ ගිණුම් දයානන්ද සමරවික්‍රම සහ සමාගම (වරලත් ගණකාධිවරු) විසින් විගණය කරන ලදී.

### වාර්ෂික වාර්තාව
මූල්‍ය වාර්තා 2012 මැයි මස 30 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### වාර්ෂික මහා සභා රැස්වීම
සීමාසහිත කුරුණෑගල වැව්ලි සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2013 ජූනි මස 20 වන බ්‍රහස්පතින්දා ප.ව. 1.30 ට අංක 11, තෙවන මහල, ඩියුක් වීදිය, කොළඹ 01 දරණ ස්ථානයේ පැවැත්වීමට නියමිතය.

වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර ඇත.

මෙම වාර්ෂික වාර්තාව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

පණ්ඩුක ජයසිංහ මහතා
සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ

ආර්.ඩබ්.එම්.ජේ.ආර්.පෙරේරා මහතා
ක්‍රියාකාරි අධ්‍යක්ෂ

සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම
ලේකම්වරු - සීමාසිහිත කුරුණෑගල වැව්ලි සමාගම
2013 - මැයි මස 31 වන දින
කොළඹදීය

# සාමුහික පාලන ප්‍රකාශය

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකත්වය, ආයතනික මධ්‍යස්ථභාවය, විනිවිදභාවය හා වගකීම් සහගත බව යන ප්‍රතිපත්ති තුල ක්‍රියා කරනු ලබයි. මෙය සමාගම සහ සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස් සමග ප්‍රබල සම්බන්ධතාවයක් ඇති කිරීම සඳහා හේතු වී ඇත. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සහ ආයතනික ස්ථායිතාව මෙන්ම ව්‍යාපාරික වටිනාකම් වර්ධනයවන අයුරින් සකස්කර ඇති ප්‍රතිපත්තීන්, ක්‍රියාපටිපාටීන්, ක්‍රියා පිලිවෙත්, නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සඳහන් සම්බන්ධතාවයන් වඩාත් සවිමත් කිරීම සඳහා හේතු වී ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්යසාධනය සඳහා වගකිවයුතු වන්නාසේම අවසාන වශයෙන් ඒ සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටින්නේය.

## වගකීම

මූලික ප්‍රතිපත්තීන් හා උපායශීලි අරමුණු සකස් කිරීමටත් ඒවා ක්‍රියාවට නැංවීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. සමාගමේ මූල්‍ය තොරතුරුවල විශ්වාසනීත්වය සහ අභ්‍යන්තර පාලන පද්ධතීන්හී සාර්ථකත්වය සඳහාද අවසාන වගකීම් දරන්නා වන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයයි.

## සංයුතිය

සභාපති / කළමණාකාර අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් සත් දෙනෙකුගෙන් යුක්ත වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබයි. සමාගමේ උපායශීලී ක්‍රමෝපායන්, වාර්ෂික අයවැය, සියළු කාර්යන් වල ප්‍රගතිය, ප්‍රාග්ධන හා මූලධන වියදම් විමසීමට ලක් කිරීම මෙම රැස්වීම් වලදී සිදුකරනු ලබයි.

සෑම රැස්වීමක් පැවැත්වීමටම සාධාරණ කාලයකට පෙර ඒ හා සම්බන්ධ ලිපි ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

2012 වසර තුලදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වා ඇති අතර අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පහත පරිදි වේ.

පණ්ඩුක ජයසිංහ මහතා
සභාපති/කලමණාකාර අධ්‍යක්ෂ - 12/12
එම්.ඒ.එස්.එන්.කුරේරා මහතා
විධායක අධ්‍යක්ෂ - 12/12
ආර්.ඩබ්ලිව්.එම්.ජේ.ආර්.පෙරේරා මහතා
ක්‍රියාකාරී අධ්‍යක්ෂ - 12/12
ඩබ්ලිව්. ජී. චන්ද්‍රිකා මහත්මිය
මහා භාණ්ඩාගාර නියෝජිත - 12/12
(2013 පෙබරවාරි 11 වන දින සිට ඉල්ලා අස්වී ඇත.)
කේ.ඩී.පීරිස් මහතා - 11/12
බී.ආර්.කුලරත්න මහතා - 12/12
අයි.ඒ.එම් අප්පුහාමි මහතා - 11/12

## විගණන කමිටුව

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මෙම කමිටුවේ සභාපතිත්වය උසුලන්නේ මහා භාණ්ඩාගාරයේ නියෝජිතවරියයි. සීමාසහිත කුරුණෑගල වැවිලි සමගමේ ප්‍රධාන විධායක නිලධාරි, විගණන කළමණාකරු සහ මූල්‍ය කළමණාකරු ආරාධිත නිලධාරින් ලෙස මෙම කමිටු රැස්වීම් වලට සහභාගී වේ. 2012 වසර තුල මෙම කමිටුව 09 වතාවක් රැස්වූ අතර විගණන කමිටු සාමාජිකයින්ගේ සහභාගීත්වය පහත පරිදි වේ.

ඩබ්ලිව්. ජී.චන්ද්‍රිකා මහත්මිය
මහා භාණ්ඩාගාර නියෝජිත - 9/9
(2013 පෙබරවාරි 11 වන දින සිට ඉල්ලා අස්වී ඇත.)
බී.ආර්.කුලරත්න මහතා - 9/9
අයි.ඒ.එම්.අප්පුහාමි මහතා - 9/9

## නීතිමය අවශ්‍යතාවලට අනුකූලවීම

සාංගමික සංස්ථාපත්‍රය, සාංගමික ව්‍යවස්ථාවලිය හා රාජ්‍ය ව්‍යාපාර සඳහා බලපවත්වන අනෙකුත් නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය හැකි සෑම උත්සාහයක්ම ගනු ලබයි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත.

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන සැකසීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම මෙම ප්‍රකාශය තුල ඇතුලත් කර ඇති අතර 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි විධිවිධාන වලට අනුකූලව සකස්කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වන විගණකවරුන්ගේ වගකීම, විගණකවරුන්ගේ වාර්තාවේ ඇතුලත් කර ඇත.

**මූල්‍ය ප්‍රකාශන තුල පහත සඳහන් ප්‍රකාශන ඇතුලත් කර ඇත.**

- ගිණුම් වර්ෂය සඳහා වූ සමාගමේ ලාභය/අලාභය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු වන අයුරින් සකස් කළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය.

- ගිණුම් වර්ෂය අවසන් වන දිනට සමාගමේ මූල්‍ය තත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු වන අයුරින් සකස් කරන ලද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.

මෙම මූල්‍ය ප්‍රකාශන පහත අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි සකස් කර තිබෙන බවට අධ්‍යක්ෂවරුන් සහතික වේ.

- සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීමටත් ඒවා අඛණ්ඩව හා සංගතභාවයෙන් යුතුව යොදා ගැනීමටත් යම් ප්‍රමාණාත්මක බැහැරවීමක් සිදු වී ඇත්නම් ඒවා සවිස්තරාත්මක ලෙස අනාවරණය කිරිමටත් කටයුතු කර ඇති බවː

- අදාල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇති බවː

- යථාර්තවාදී අන්දමින් හා සාධාරණ ලෙස සියළුම නිශ්චයන් සහ ඇස්තමේන්තු සිදුකිරීමට කටයුතු කර ඇති බවː

මීට අමතරව, සමාගම පවත්නා තත්ත්වයෙන්ම එහි ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව දුරදක්නා කාලයක් කරගෙන යාමට අවශ්‍ය තරම් සම්පත් ඇති බව හා ඒ අනුව අඛණ්ඩ පැවැත්ම සංකල්පය මත පිහිටා සමාග මේ ගිණුම් ප්‍රකාශන සැකසීම යුක්ති සහගත බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව ප්‍රමාණවත් තරම් ගිණුම් වාර්තා පවත්වාගෙන යාමටත්, සමාගමේ මූල්‍ය තත්ත්වය යහපත් මට්ටමකින් පවත්වා ගෙන යාමටත්, මූල්‍ය ප්‍රකාශනයන් 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව ඉදිරිපත් කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. සමාගම සතු වත්කම් ආරක්ෂා කිරීමටත්, වංචා හා වෙනත් අක්‍රමිකතා හඳුනාගෙන ඒවා වැළැක්වීම පිණිස සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රම ඇති කිරිමටත් අධ්‍යක්ෂවරුන් බැඳි සිටි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමටත්, විගණන මතය ප්‍රකාශ කිරීම සඳහා විගණකවරුන් විසින් සුදුසු හා අවශය යැයි හැඟෙන කටයුතු ක්‍රියාවට නැංවීමටත්, විගණන විමසුම් සිදුකිරීමටත් අවශ්‍ය ඉඩකඩ සලසා දීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැඳි සිටී.

සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වෙන දිනට අඩුම වශයෙන් වැඩකරන දින 15 කට පෙර සමාගමේ සියළුම කොටස්කරුවන් වෙත වාර්ෂික වාර්තාව යැවීම සඳහා කටයුතු කර ඇත.

**අනුකූලතා ප්‍රකාශය**

සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු සහ සමාග මේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු දන්නා අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති බවට හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

**අධ්‍යක්ෂවරුන්ගේ නියෝගය පරිදි**

සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම
ලේකම්වරු - සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම

# *Dayananda Samarawickrema & Co.,*

CHARTERED ACCOUNTANTS

Partners
H.G.Dayananda F.C.A
J.Rajasuriya F.A.C., BA
K.G. Chandana Kumara A.C.A

No. 20/26, Station Lane, (Janatha Pola Road)
NUGEGODA, SRI LANKA.
Tele : 2854614, 2809650, 2822940
Fax : 2820112
E - mail : dsandca@sltnet.lk

**සීමාසහිත කුරුණෑගල වැව්ලි සමාගමේ සියළුම කොටස්කරුවන් වෙත,**

සීමාසහිත කුරුණෑගල වැව්ලි සමාගමේ 2012 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශන එනම්, එම දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එම දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්කරණ සටහන් අප විසින් විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වන අධ්‍යක්ෂවරුන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන කළමනාකරණයේ නියෝජනයක් වේ. මෙම ප්‍රකාශ පිළියෙල කිරීමේදී වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ නිශ්චයන් කිරීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදි යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ක්‍රම තීරණය කිරිමද කළමනාකාරිත්වයේ වගකීමකි. මීට අමතරව වැරදි හා වංචා අවම වන ලෙස අභ්‍යන්තර පාලන ක්‍රමයන් ඇති කිරිමද ඒවා ක්‍රියාකාරි ලෙස පවත්වාගෙන යාමද කළමනාකරණයේ වගකීමකි.

**විගණනයේ විෂය පථය හා මතය ප්‍රකාශ කිරිමේ පදනම**

විගණනවරුන් ලෙස අපගේ වගකීම වන්නේ අපගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන ගැන මතයක් ප්‍රකාශ කිරිමයි. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව අපි අපගේ විගණනය කරගෙන ගියෙමු. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍යතාවයන්ගෙන් තොරදැයි සාධාරණ තහවුරුවක් ලබා ගැනීමේ අරමුණින් අප විසින් විගණනය සැලසුම් කර ඉටු කිරිම මෙම ප්‍රමිතීන් මගින් අවධාරණය කෙරේ.

මූල්‍ය ප්‍රකාශන වල අගයන් හා හෙළිදරව් කිරිම් තහවුරු කිරිමට නියැදි පදනමක් මත සාක්ෂි පරීක්ෂා කිරිම මූල්‍ය විගණනයට ඇතුලත් වේ. භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ කළමනාකරණය විසින් කරන ලද වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරිම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම ඇගයීමකට ලක් කිරීම විගණනයට ඇතුලත් වේ. අපගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව අපගේ විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු හා පැහැදිලි කිරීම් අපි ලබා ගතිමු. එමනිසා අපගේ විගණනය අපගේ මතය සඳහා සාධාරණ පදනමක් වන්නේ යැයි අපි විශ්වාස කරමු.

**ප්‍රකාශිත මතය**

අපගේ මතය වන්නේ අපගේ විගණනයෙන් පෙනී යන අන්දමට 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමාගම නිසි පරිදි ගිණුම් පොත්පත් පවත්වන ලද අතර මූල්‍ය ප්‍රකාශන මගින් සමාගමේ ගණුදෙනු, ක්‍රියාකාරිත්වය හා තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දර්ශණයක් පෙන්නුම් කරන බවත් 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වන ලාභය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ගණනය කර ඇති බවත් ය.

**වෙනත් නීතිමය හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා පිළිබඳ ප්‍රකාශය**

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 151(2) දරණ සමාගම් පනතේ විධිවිධාන වලටද අනුකූලව සකස් කර ඇති බව අපගේ මතයයි.

දයානන්ද සමරවික්‍රම සහ සමාගම
වරලත් ගණකාධිකාරිවරු
නුගේගොඩ
17-05-2013

# ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා | සටහන | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|---|
| අයභාරය | 01 | **483,726,983** | 509,885,889 |
| විකුණුම් පිරිවැය | 02 | **(275,499,986)** | (252,452,873) |
| දළ ලාභය | | **208,226,997** | 257,433,015 |
| | | | |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 03 | **76,353,187** | 62,369,139 |
| පරිපාලන සහ පොදු වියදම් | 04 | **(104,816,036)** | (88,442,422) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ලාභය | | **179,764,148** | 231,359,733 |
| | | | |
| මූල්‍ය පිරිවැය | 05 | **(31,887,333)** | (28,622,529) |
| පොලී ආදායමට පෙර ලාභය | | **147,876,815** | 202,737,204 |
| | | | |
| පොලී ආදායම | 06 | **38,200,820** | 22,426,141 |
| | | | |
| බදු පෙර ලාභය | | **186,077,635** | 225,163,345 |
| ආදායම් බදු වියදම | 07 | **(15,784,867)** | (33,126,698) |
| වසරේ ලාභය | | **170,292,768** | 192,036,647 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | **-** | - |
| ශුද්ධ වෙනත් විස්තීර්ණ ආදායම් (බදු පසු) | | **-** | - |
| වසරේ මුළු විස්තීර්ණ ආදායම | | **170,292,768** | 192,036,647 |
| | | | |
| කොටසක ඉපැයුම (රු) | 08 | **8.51** | 9.60 |

විශේෂයෙන් සඳහන් කර නොමැති විටක සියළුම අගයන් රුපියල් වලින් දක්වා ඇත.
වරහන් තුල දක්වා ඇත්තේ අඩු කිරීම්ය.

# මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය

| | සටහන | 31.12.2012<br>රු. | 31.12.2011<br>රු. | 01.01.2011<br>රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| බදු අයිතිය යටතේ ඇති හිස් ඉඩම් | 09 | **102,897,569** | 105,886,102 | 109,056,062 |
| බදු අයිතිය යටතේ ඇති නිශ්චල වත්කම් (හිස් ඉඩම් හැර) | 10 | **55,253,756** | 60,310,299 | 65,152,286 |
| මේරූ හා නොමේරූ වගාවන් | 11 | **548,303,715** | 482,401,689 | 435,682,802 |
| දේපල පිරියත හා උපකරණ | 12 | **154,398,849** | 96,369,292 | 81,537,171 |
| වෙනත් මූල්‍ය වත්කම් | 13 | **4,938,188** | 966,845 | 1,403,852 |
| මුළු ජංගම නොවන වත්කම් | | **865,792,077** | 745,934,227 | 692,832,173 |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | 14 | **37,317,228** | 58,592,976 | 22,790,543 |
| තැන්පතු හා ඉදිරියට ගෙවීම් | | **5,778,757** | 3,938,157 | 2,193,309 |
| ආපසු ගෙවන ආදායම් බදු | | **1,467,715** | | |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 15 | **82,359,530** | 87,249,761 | 49,008,561 |
| වෙනත් මූල්‍ය වත්කම් | 13 | **4,004,367** | 1,173,048 | 836,904 |
| කෙටි කාලීන ආයෝජන | 16 | **320,000,000** | 300,637,576 | 249,999,991 |
| මුදල් හා බැංකු ශේෂයන් | 17 | **5,659,031** | 20,743,164 | 24,978,703 |
| මුළු ජංගම වත්කම් | | **456,586,628** | 472,334,682 | 349,808,011 |
| **මුළු වත්කම්** | | **1,322,378,705** | 1,218,268,909 | 1,042,640,184 |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | | |
| කොටස් ප්‍රාග්ධනය | 18 | **200,000,010** | 200,000,010 | 200,000,010 |
| රඳවා ගත් ලාභය | | **764,961,182** | 644,668,414 | 522,631,767 |
| | | **964,961,192** | 844,668,424 | 722,631,777 |
| විලම්භිත වියදම | | **(2,753,577)** | (4,299,018) | (4,289,882) |
| මුළු ස්කන්ධය | | **962,207,615** | 840,369,406 | 718,341,895 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂිත | 19 | **65,791,705** | 71,117,801 | 62,791,390 |
| කල්බදු ගිවිසුම යටතේ ඇති බැඳියාවන් - ජංගම කොටස හැර | 20 | **74,909,429** | 78,474,633 | 82,039,837 |
| ප්‍රදාන හා ආධාර | 21 | **-** | 8,677,207 | 8,937,792 |
| විලම්භිත බදු බැරකම | 22 | **51,177,581** | 43,171,577 | 26,182,028 |
| මුළු ජංගම නොවන වගකීම් | | **191,878,715** | 201,441,218 | 179,951,047 |
| **ජංගම වගකීම්** | | | | |
| කල්බදු ගිවිසුම යටතේ ඇති බැඳියාවන් - ජංගම කොටස | 20 | **3,565,204** | 3,565,204 | 3,565,204 |
| සුභ සාධක අරමුදල් | | **-** | - | 371,342 |
| ගෙවිය යුතු ආදායම් බදු | | | 9,904,497 | 1,081,006 |
| ලැබූ අත්තිකාරම් | 23 | **204,627** | 20,585,889 | 16,514,962 |
| වෙළඳ හා අනෙකුත් ගෙවීමට ඇති දෑ | 24 | **164,522,544** | 142,402,695 | 122,814,728 |
| මුළු ජංගම වගකීම් | | **168,292,375** | 176,458,285 | 144,347,242 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **1,322,378,705** | 1,218,268,909 | 1,042,640,184 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව පිලියෙළ කර ඇත.

.............................................
පී .එම්. ඩී. ජී. ප්‍රේමතිලක
මූල්‍ය කළමනාකරු

මූල්‍ය වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කළේ

.............................................
පණ්ඩුක ජයසිංහ
සභාපති /කළමනාකාර අධ්‍යක්ෂ
2013 මැයි 17, කොළඹදී.

.............................................
ආර්.ඩබ්.එම්.ජේ. ආර්. පෙරේරා
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

# ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා

| | කොටස් ප්‍රාග්ධනය රු. | රඳවාගත් ලාභය රු. | එකතුව රු. |
|---|---|---|---|
| **2011 ජනවාරි 01 දිනට ශේෂය** | 200,000,010 | 522,631,767 | 722,631,777 |
| මුළු විස්තීර්ණ ආදායම - වසරේ ලාභය | - | 192,036,647 | 192,036,647 |
| 2009 වසර සඳහා ලාභාංශ ගෙවීම් | - | (30,000,000) | (30,000,000) |
| 2010 වසර සඳහා ලාභාංශ ගෙවීම් | | (40,000,000) | (40,000,000) |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | **644,668,414** | **844,668,424** |
| 2012 වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | 170,292,768 | 170,292,768 |
| 2011 ලාභාංශ ගෙවීම් | - | (50,000,000) | (50,000,000) |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | **764,961,182** | **964,961,192** |

අඩු කිරීම් වරහන් තුල දක්වා ඇත.
ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(සඳහා යෙදවූ) මුදල් ප්‍රවාහය** | | |
| බදු පෙර ලාභය | **186,077,635** | 225,163,345 |
| **ගැලපීම්** | | |
| ක්‍ෂයවීම්/ක්‍රමක්‍ෂයවීම් | **29,381,368** | 26,136,769 |
| කල් බදු ගිවිසුම් මත වූ පොලී වියදම් | **30,847,790** | 28,429,380 |
| තාවකාලික බැංකු ණය මත වූ පොලී වියදම | **210,986** | - |
| සේවක ණය දීම් ක්‍රමක්‍ෂයවීම් | **828,557** | 193,149 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | **5,125,526** | 15,270,441 |
| ප්‍රදාන ක්‍රමක්‍ෂයවීම් | **(260,585)** | (260,585) |
| පොලී ආදායම් | **(38,200,820)** | (22,426,141) |
| දේපල පිරියත හා උපකරණ අපහරණය කිරීමෙන් ලත් ලාභය | **(443,035)** | (2,220,470) |
| දේපල පිරියත හා උපකරණ මත දරණ ලද අයහාර වියදම් ලියාහැරීම | **9,079,178** | - |
| ආදායම් බදු ගෙවීම | **(19,555,293)** | (7,625,970) |
| කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා සඳහා වෙන් කිරීම් | **22,717,215** | 21,155,711 |
| ප්‍රසාද දීමනා සඳහා වෙන් කිරීම් | **7,458,393** | 7,089,625 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | **233,266,915** | 290,905,254 |
| | | |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| තොගවල (වැඩිවීම්)/ අඩුවීම් | **21,275,748** | (35,802,432) |
| තැන්පතු හා ඉදිරියට ගෙවීම්වල (වැඩිවීම්)/ අඩුවීම් | **(1,840,600)** | (1,744,848) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වල (වැඩිවීම්)/ අඩුවීම් | **9,714,727** | (37,498,022) |
| විලම්භිත වියදම්වල (වැඩිවීම්)/ අඩුවීම් | **1,545,441** | (9,137) |
| ලැබුනු අත්තිකාරම්වල වැඩිවීම්/ (අඩුවීම්) | **(20,381,262)** | 4,070,928 |
| සුභ සාධන අරමුදල්වල වැඩිවීම්/ (අඩුවීම්) | **-** | (371,342) |
| වෙළඳ හා වෙනත් ගෙවියයුතු දෑ වල වැඩිවීම්/ (අඩුවීම්) | **(3,398,063)** | 4,373,651 |
| පාරිතෝෂිත ගෙවීම් | **(8,134,590)** | (6,944,030) |
| කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා ගෙවීම් | **(21,158,401)** | (13,383,339) |
| ප්‍රසාද දීමනා ගෙවීම් | **(7,231,825)** | (6,952,787) |
| **මෙහෙයුම් කටයුතු තුලින් ජනනය වූ/(සඳහා යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | **203,658,090** | 196,643,896 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(සඳහා යෙදවූ) මුදල් ප්‍රවාහය** | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | **(164,809,564)** | (81,628,173) |
| දේපල පිරියත හා උපකරණ අපහරණයෙන් ලද මුදල් | **2,488,920** | 4,172,812 |
| ලැබුණු පොලි ආදායම | **32,547,768** | 21,489,814 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(සඳහා යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(129,772,876)** | (55,965,547) |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(සඳහා යෙදවූ) මුදල් ප්‍රවාහය** | | |
| බදු කුලී ගෙවීම් | **(12,593,275)** | (24,377,166) |
| තාවකාලික බැංකු ණය සඳහා පොලි ගෙවීම් (ලංකා බැංකුව) | **(210,986)** | - |
| කාර්ය මණ්ඩලයට ලබා දුන් ණය | **(11,092,835)** | (998,751) |
| කාර්ය මණ්ඩල ණය අයකර ගැනීම් | **4,290,173** | 1,099,614 |
| ලාභාංශ ගෙවීම් | **(50,000,000)** | (70,000,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(සඳහා යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(69,606,923)** | (94,276,303) |
| | | |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | **4,278,291** | 46,402,046 |
| **වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම** | **321,380,740** | 274,978,694 |
| **වසරාවසානයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම - සටහන (අ)** | **325,659,031** | 321,380,740 |

| **සටහන (අ) - මුදල් හා මුදල් සමාන දෑ (දිනට)** | **31.12.2012**<br>රු. | 31.12.2011<br>රු. |
|---|---|---|
| ස්ථිර තැන්පතු - ලංකා බැංකුව | **79,500,000** | 113,500,000 |
| ස්ථිර තැන්පතු - මහජන බැංකුව | **10,000,000** | 28,000,000 |
| ස්ථිර තැන්පතු - ජාතික ඉතිරි කිරීමේ බැංකුව | **230,500,000** | - |
| භාණ්ඩාගාර බිල්පත් | **-** | 159,137,576 |
| භාණ්ඩාගාර බිල්පත් මිලදීගැනීම් | **-** | 7,000,000 |
| තැපැල්/මුද්දර | **8,042** | 4,252 |
| මාර්ගස්ථ මුදල් | **47,585** | 1,729,081 |
| බැංකු මුදල් | **4,476,403** | 7,281,098 |
| අතැති මුදල් | **1,127,001** | 4,728,733 |
| | **325,659,031** | 321,380,740 |

අඩු කිරීම් වරහන් තුල දක්වා ඇත.
ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම වාර්තාවේ අඩංගු මූල්‍ය ප්‍රකාශන හා වෙනත් දත්ත ඇගැයීමට පාඨකයාට පහසු වනු පිණිස සමාගම විසින් අනුගමනය කරණ ලද තීරණාත්මක/ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයන් පහත සඳහන් කරනු ලබයි.

## 1.0 පොදු ප්‍රතිපත්ති

### 1.1 නෛතික ස්වභාවය

කුරුණෑගල වැවිලි සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව 1982 අංක. 17 දරණ සමාගම් පනත යටතේ පිහිටවූ සීමාසහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කුරුණෑගල දඹුල්ල පාරේ අංක 80 දරණ ස්ථානයේ පිහිටා ඇත.

සමාගමේ සියලු කොටස්වල අයිතිය ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය සතු වේ.

### 1.2 ව්‍යාපාරයේ ස්වභාවය

සමාගම ප්‍රධාන වශයෙන් පොල් හා රබර් වතු කළමනාකරණය සිදු කරයි. සමාගම විසින් පාලනය කරනු ලබන පළාත් වතු 09 ක් ඇති අතර ඒවා දිවයිනේ විවිධ ප්‍රදේශ වල විසිරී පවතී. එම පළාත් වතු පහත පරිදි වේ.

2012 වර්ෂය තුලදී පරිපාලන අවශ්‍යතාවය මත වාරියපොල වතුයාය, හිරියාල වතු යාය හා ඒකාබද්ධ කරන ලදී.

අත්තනගල්ල
කටුගම්පොල
දඹදෙණිය
කුරුණෑගල
ධාතුසේනපුර
මහයාය
දොඩන්ගස්ලන්ද
නාරම්මල
හිරියාල

### 1.3 අනුකූලතා ප්‍රකාශය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වාර්ෂික ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට (SLRFS/LKAS) සහ 2007 අංක 07 දරණ පනතේ විධිවිධාන වලට අනුකූලව සකස් කර තිබේ.

SLRFS/LKAS - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව පිළියෙල කළ ප්‍රථම මූල්‍ය ප්‍රකාශන වන්නේ මෙම මූල්‍ය ප්‍රකාශනයි.

**පළමුවර යොදා ගැනීම**

SLRFS - ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන් අනුව පිළියෙල කළ සමාගමේ ප්‍රථම මූල්‍ය ප්‍රකාශන වන්නේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශන යි. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයද ඇතුලත්ව මීට පෙර වර්ෂ සඳහා පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශන SLAS - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කරන ලදි.

ගිණුම්කරන ප්‍රතිපත්ති වල දක්වා ඇති ආකාරයට, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ඊට අදාල වන සංසන්දනාත්මක තොරතුරු ද ඇතුලත්ව, (2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂයට අදාල තොරතුරු) SLRFS - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මූල්‍ය තත්ත්වය පිළිබඳ ආරම්භක ප්‍රකාශය, SLRFS - ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන් වලට සංක්‍රාන්ති වූ දිනට එනම්, 2011 ජනවාරි 01 වැනි දිනට පිළියෙල කර ඇත.

### 1.4 ඉදිරිපත් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම සහ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇති අතර උද්ධමනය සඳහා වන ගැලපීමක් ගිණුම් ප්‍රකාශන තුල සිදු කර නොමැත.

**ඉදිරිපත් කිරීම සහ ව්‍යවාහාරික මුදල්**

එක හා සමාන ප්‍රමාණාත්මක අයිතම සමුච්චිත කොට ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක මෙන්ම අසමාන ස්වභාවයේ අයිතම වෙනම අනාවරණය කර ඇති අතර ප්‍රමාණාත්මක නොවන අයිතමයන් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 1 (LKAS 1) 'ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම' මගින් ඉඩ දි ඇති පරිදි සමුච්චිත කොට දක්වා ඇත.

මෙම ගිණුම් ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

විශේෂයෙන් දක්වා නැත්නම් සියලුම අගයන් ආසන්න රුපියලට වටයා ඇත,

**සංසන්දනාත්මක තොරතුරු**

පසු ගිය වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදි වඩාත් පැහැදිලි, උචිත හා ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ගැලපෙන පරිදි ඉදිරිපත් කිරීමේ අභිප්‍රායෙන් පෙර වර්ෂයේ තොරතුරු අවශ්‍ය අවස්ථාවන්හිදි සංශෝධනය කර හෝ නැවත වර්ගීකරණය කිරීම හෝ සිදු කර ඇත.

## 2.0 ආදායම හඳුනා ගැනීම

වැවිලි කර්මාන්තයේ ව්‍යවහාරයට අනුව, බහු වාර්ෂික බෝග අලෙවියෙන් ලැබෙන ආදායම, ලාභ හෝ අලාභ එම අස්වැන්න නෙලා ගත් වර්ෂයට අදාල ලෙස සලකනු ලබයි.

දේපල, පිරියත හා උපකරණ අපහරණයෙන් ලැබෙන ලාභය හෝ අලාභය විස්තීර්න ආදායම් ප්‍රකාශයේ සටහන් කර ඇත.

පොලී සහ අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගෙන ඇත.

### 3.0 වියදම් හඳුනා ගැනීම

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා සහ දේපල, පිරියත හා උපකරණ නඩත්තු කිරීම සඳහා දරණ සියළුම වියදම් වසරේ ලාභ/(අලාභ) ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන ඇත.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුලින් සමාගමේ ප්‍රගතිය සත්‍ය හා සාධාරණ ආකාරයෙන් නිරූපණය කිරීම සඳහා එය පිළියෙල කිරීමේ වඩාත්ම උචිත ක්‍රමය "වියදම් ක්‍රියාත්මක වන ක්‍රමය" බව කළමනාකාරීත්වයේ මතයයි.

### 4.0 බදුකරණය

#### 4.1 ආදායම් බදු

ආදායම් බදු සඳහා වෙන් කිරීම් කරනු ලබන්නේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති ආදායම් සහ වියදම් මත පදනම්ව වන අතර, එය ගණනය කරනු ලබන්නේ 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත සහ ඊට අදාළ සංශෝධනයන්ට යටත්වය.

#### 4.2 විලම්භිත බදු

අනාගතයේදී උපලබ්ධි වන සියළුම බදුවන සහ බදු අඩු කල හැකි කාල වෙනස්කම් සඳහා විලම්භිත බදු ගණනය කර ඇත.

සියලු බදු අඩු කල හැකි කාල වෙනස්කම්, ඉදිරියට ගෙන ආ භාවිතා නොකල බදු බැර සහ භාවිතා නොකල බදු අලාභ වෙනුවෙන් විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලබයි. මෙම හඳුනාගැනීම, බදු අඩු කල හැකි කාල වෙනස්කම්, ඉදිරියට ගෙන ආ භාවිතා නොකල බදු බැර සහ භාවිතා නොකල බදු අලාභ අඩුකරගත හැකි බදුවන ලාභයක් ඇතිවනතාක් දුරට සිදුකර ගෙනයනු ලබයි.

මෙම විලම්භිත බදු වත්කමෙහි ධාරන අගය සෑම මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනයකදීම සමාලෝචනය කරනු ලබයි. එහිදී, ප්‍රමාණවත් බදු වන ලාභයක් නොපැවතීම හේතුකොටගෙන මෙම විලම්භිත බදු වත්කම සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ භාවිතා කල නොහැකි තත්ත්වයකට පත්ව ඇත්ද යන්න සලකා බලන අතර එසේ වී ඇත්නම් එය භාවිතා කල හැකි/අඩු කල හැකි ප්‍රමාණය දක්වා අඩු කරනු ලබයි.

### 5.0 මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට පසු සිදුවීම්

මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට පසුව, සිදු වූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සඳහා මූල්‍ය ප්‍රකාශන තුල අදාළ ගැලපීම් හෝ අනාවරනය කිරීම් සිදු කර ඇත.

### 6.0 ණය ගැණුම් පිරිවැය

මෙවැනි වියදම් දැරූ වර්ෂයේ දී එම වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම් කටයුතු කර ඇත. නමුත් යම්කිසි සුදුසුකම් ලබන වත්කමක් ලබා ගැනීමට හෝ නිපදවීමට හෝ ගොඩනැගීමට හෝ ලබා ගත් ණයක් වෙනුවෙන් දරනු ලබන ණය ගැණුම් පිරිවැය එම වත්කමේ පිරිවැයක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇත.

### 7.0 වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම

#### 7.1 තොග

නිෂ්පාදිත තොග හැර අනෙකුත් සියළුම තොග පිරිවැය හෝ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි වටිනාකම යන අගයන්ගෙන් අඩු අගයට ගණනය කර ඇත. ශුද්ධ උපලබ්ධි වටිනාකම යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුල එම තොග විකිණීමෙන් ලැබෙන වටිනාකමින් එම තොග විකිණීම සඳහා හෝ විකුණුම් කළ හැකි තත්ත්වයට පත් කිරීම සඳහා හෝ දැරිය යුතු වන වියදම් අඩු කළ පසු ලැබෙන අගයයි.

